# උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රංශ සංචාරය සහ එහිදී එතුමා **J9 Radio** ආයතනයේ යුරෝපා ප්‍රධාන ප්‍රවෘත්ති නිළධාරි සමග කළ සම්මුඛ සාකච්ඡාව.









**ආයුබෝවන්**

**ගරු ඇමතිතුමනි.**

**උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ඉතා සාදරයෙන් පිළිගන්නවා . මෙය විශේෂිත වූ අවස්ථාවක්,**

**ඔබතුමා ප්‍රංශ රටට පැමිණිලා මෙම රටේ තිබෙන විශේෂිත ස්ථානයක් වූ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයට පැමිණ අපේ අතිපූජනීය පරවාහැර චන්ද්‍රරතන නායක හිමියන් දැකගන්නට පැමිණ නායක ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය ගලගොඩඅත්තේ ඤාණසාර හිමිපාණන්ගේ පිරිත් ආශිර්වාදයෙන් පසු සූදානම් කළ ඉතා සරල භෝජන සංග්‍රහයෙන් පසුව සුහද කෙටි සංවාදයකටයි මේ සූදානම් වන්නේ,**

**J9 Radio ආයතනයේ යුරෝපා ප්‍රධාන ප්‍රවෘත්ති නිළධාරියා ලෙසින් මා ඔබෙන් අසන පළමු ප්‍රශ්නය?**

**ප්‍රශ්නය: ගරු ඇමතිතුමනි ඔබ අධ්‍යාපන ඇමති වශයෙන් පත් වි දැනට සෑහෙන කාලයක් ගතවී තිබෙනවා මෙම කාලය තුළ ඉහත තිබු කාලයට වඩා යම් වෙනසක් සිදුව තිබේද? යන්න දැනගන්න කැමතියි.**

**පිළිතුර:** ඔව් විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යංශය මම බාරගන්නා විට අභියෝග රැසකට මුහුණ දීලා හිටියා එක් පැත්තකින් ගුරුවරුන්ගේ නිළධාරින්ගේ අධ්‍යක්ෂකවරුන්ගේ වෘත්තිය ගැටළු තිබුනා. අනෙක් පැත්තෙන් පාසල් වල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිකිරිම පිළිබඳව ප්‍රශ්න තිබුනා ඊලගට ගුරුවරුන්ගේ හිගය පිළිබඳ ප්‍රශ්නය තිබුනා. ප්‍රධාන වශයෙන් මේ මූලික කරුණු වලට පිළිතුරු දීම සඳහා ක්‍රියාමාර්ග රැසක් අරගත්තා. මේ අවුරුදු දෙකයි මාස තුනක් තුළදී අතිගරු ජනාධිපතිතුමා ජනාධිපතිකම භාරගත්තායින් පසුව මේ අමාත්‍යංශය මට භාරදුන්නා . 2005 නොවැම්බර් මාසයේ සිට මේ දක්වා අපි ගුරුවරු 27000 මේ ක්ෂේත්‍රයට අලුතින් බඳවා ගත්තා. මෙයින් 18000 ක් උපාධිධාරීන් 6000 ක් විද්‍යාපීඨ ගුරුවරුන්

ඊලගට වතුකරයේ පාසල් වලට විශාල හිගයක්ව තිබු ද්‍රවිඩ මාධ්‍ය ගුරුවරු 3779 ක් බඳවා ගත්තා. ඉතින් මෙයින් පැහැදිලි කරලා පෙන්නුම් කෙරෙන්නේ සිංහල ද්‍රවිඩ මුස්ලිම් යන් සෑම ජන කොටසකටම අධ්‍යාපනය ලබාගැනීමේ මූලික අයිතිවාසිකම රජය මගින් තහවුරු කරල දීලා තියෙන බවයි.

ඊලගට ගුරු පුහුණුව විදිමත් කරන්න කටයුතු කරලා තිබෙනවා ඒ තුලින් පරිපූර්ණ ගුරුවරුන් පන්ති කාමරයට ලබාදීමේ අවශ්‍යතාවය සුපුරා තිබෙනවා. ඒ අනුව 18000 ක් බඳවා ගත්තා මේ අයගෙන් 10000 ක් පමණ ගුරු පුහුණුව අවසන් කරලා අනික් අය දැනට පුහුණුව ලබමින් සිටිනවා ඊලගට මේ අයගේ තිබූ වෘත්තිය ගැටළු උසස්වීම් වැටුප් වර්ධක වැටුප් විෂමතා මේ ගැන අප සෑහෙන දුරකට අදාල ප්‍රශ්න විසදන්න කටයුතු කරලා තියෙනවා.

ඊලග කාරණය තමයි අපේ දරුවන්ගේ අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමින් පවත්වාගෙනයාමට තිබෙන්නා වූ අවශ්‍යතාවය ඒ අනුව අප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අපේ පාසල් තුළට ගෙනගිහිල්ලා මේ වන විට පරිගණක විද්‍යාගාර 3000 ක් පාසල් වලට දීලා තිබෙනවා තවද පරිගණක යන්ත්‍ර දෙක තුන බැගින්ද කුඩා මට්ටමේ පාසල් වලට දීලා තිබෙනවා. ගිය නොවැම්බර් මාසයේ අපි රජය හා ගිවිසුමකට ආවා ආසියානු සංවර්ධන බැංකුවේ ඩොලර් මිලියන 105 ක ආධාර වැඩසටහනක් යටතේ 2012 වන විට පරිගණක විද්‍යාගාර 2250 ක් අලුතින් ලබාදෙන්න. ඒ වැඩ දැන් ආරම්භ කරලා තිබෙනවා ඊලගට ගුරුවරු අවශ්‍යයි මේ ක්ෂේත්‍රයට මෘදුකාංග නිෂ්පාදනය කරන්න හා විෂයන් වලට. ඒ වැඩ කටයුතු දැන් කෙරීගෙන යනවා ඒ අනුව ලංකාවේත් අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීමේ උපකරණයක් හැටියයට පන්ති කාමරය තුළ භාවිතා කරමින් සහ ඒ තාක්ෂණය යොදා ගනිමින් වෙනත් දියුණු රටවල ගෙනයන අධ්‍යාපනය හා සමාන මට්ටමක් ලබාදීමේ වැඩපිළිවලක් කරගෙන යනවා.

**ප්‍රශ්නය:** **ඉතාමත් සන්තෝෂයි ඇමතිතුමා මම අහපු කුඩා ප්‍රශ්නයට පුළුල් උත්තරයක් දුන්නා. මගේ දෙවැනි ප්‍රශ්නය වී තිබුනෙත් ඕකට ආසන්න ප්‍රශ්නයක්. ඔබතුමා ඒ ගැන පැහැදිලි කලා ඒ වුනත් මම අහන්න කැමතියි ගමේ පාසල් වලටත් ඔය නගරයේ පාසල්වල තිබෙන පහසුකම් තිබෙනවාද? දක්ෂ ගුරුවරු ලබාදෙනවාද? ඒ දක්ෂ ගුරුවරු ගමටත් ලබාදී තිබෙනවාද?**

**පිළිතුර:** ඔව් මේ සඳහා අපි අධ්‍යාපන අමාත්‍යංශයෙන් ජාතික ගුරු මාරු ප්‍රතිඵත්තියක් හඳුන්වා දී තිබෙනවා ඒ ගුරුවරු ඒ ප්‍රතිපත්තිය අනුව තමයි ක්‍රියාත්මක වෙන්නේ දැන් මේවන විට විද්‍යාපීඨ වලින් පිටවෙන දක්ෂ ගුරුවරුන්ගේ ප්‍රථම පත්වීම ග්‍රාමීය ප්‍රදේශවලට ලබාදීමට ප්‍රතිපත්තියක් ලෙසට මෙවර අමාත්‍ය මණ්ඩලය පිලි අරන් තිබෙනවා ඒ අනුව අපි ඊලග මාසය මැයි 15 වැනිදා වන විට නව පත්වීම් 2800 ක් දෙනවා. ගණිත, ඉංග්‍රිසි, විද්‍යාව යන විෂයයන් සම්බන්ධව ඒ සියලු පත්වීම් යන්නේ හම්බන්තොට මොණරාගල අම්පාර ත්‍රිකුණාමලය අනුරාධපුරය පොළොන්නරුව යන දුෂ්කර ප්‍රදේශවලටයි. ඒවායේ කාලයක් උගන්වපු අය තමයි ග්‍රාමිය පාසල් වලට ඒනනේ ඒ විදිහට ගුරුමාරු ප්‍රතිපත්තියක් අරඹා කරගෙන යනවා.

තවද ජාතික වශයෙන් ඉතිහාස විෂය අපෙන් බැහැර කරලා තිබුණා. කාලයක් තිස්සේ නමුත් දැන් නැවත වතාවක් ඉතිහාස විෂය අනිවාර්ය විෂයක් ලෙසට හඳුන්වලා දීලා තියෙනවා. ඒ වගේම සිංහල භාෂාව සමග සිංහල සාහිත්‍ය ද ඇතුලත් කරලා විෂය නිර්දේශය හදලා තියෙන්නේ. ඒ වගේම පුරවැසි අධ්‍යාපනය තුළින් කොහොමද ජාතික සමගිය සහජීවනය ඇති කරගන්නේ කියලා සාකච්ඡාකරලා විශාල වැඩකොටසක් කරලා තිබෙනවා.

තවද දෙවන භාෂාව ඉගැන්වීම ඒ කියන්නේ සිංහල ළමුන්ට දෙමල බසත් දෙමල ළමුන්ට සිංහල බසත් ඉගැන්විමට අපි දැන් ගුරුවරු පලාත් මට්ටමින් පුහුණු කරලා පාසල් වලට යෙදවීමේ වැඩපිලිවෙල කරගෙන යනවා .මෙයට අමතරව ඉංග්‍රිසි භාෂාව ජාත්‍යන්තර භාෂාවක් ලෙස අපි ප්‍රචලිත කිරිමේ වැඩ පිලිවෙලක් කරගෙන යනවා. මේවන විට ඉංග්‍රිසි මාධ්‍යයෙන් 06 වසරෙන් ඉහල අධ්‍යාපනය ලබාදෙනවා ගමේ පාසල්වල පවා. ඒ අනුව අපි ලොව වෙනත් දියුණු රටවල් හා විශේෂයෙන් කලාපයේ වැඩිම සාක්ෂරතාවය ඇති රට බවට අපි පත්කරලා තිබෙනවා .ඒ වගේම විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදීත් යම් සමිකරණයකට අනුවයි අපි පාසල් වලට සම්පත් දෙන්නේ ඒ අනුව ගම නගරය කියා වෙනසක් නැතිව ගමේ පාසලටත් මේවා යැවිමට වැඩපිලිවෙලක් ක්‍රියාත්මක වෙනවා .

විදුලිය නැති ප්‍රදේශවලට අපේ රටේ සාමාන්‍යයෙන් දැනට සියයට අසූවකට තමයි ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලිය දීලා තියෙන්නනේ ඉතිරි සියයට විස්ස සමහර ගම්වලට විදුලිය නැහැ නමුත් ඒ ගම්වල තිබෙන පාසල් වලට සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කර පරිගණක විද්‍යාගර දී තිබෙනවා එය 10 බැගින් 100 ක් ලෙස ව්‍යාපෘතිය අවසන් කරලා තිබෙනවා. තව 1500 ක් ලබාදීමට ඩොලර් මිලියන 52 ක ව්‍යාපෘතියකට දැන් භාණ්ඩාගාරයෙන් අනුමැතිය ගන්න කටයුතු කරලා තිබෙනවා .

ඒ වගේම සම්පත් ගමට ලබාදීමේ වැඩපිලිවෙළ මහින්ද චින්තන වැඩපිලිවෙල යටතේ ජනපතිතුමාගේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරිමත් පාසල් අධ්‍යාපනය දියුණු කිරිම යටතේ ඉසුරු පාසල් ලෙස ඒ කියන්නේ සැම ප්‍රා/ලේ කොට්ඨාශයකම තෝරාගත් එක් පාසලක් ඉහලම මට්ටමට දියුණු කිරිමේ වැඩපිලිවෙල යටතේ දැන් මේවන විට පාසල් 150 ක් තෝරාගෙන තිබෙනවා එක් පාසලකට රුපියල් මිලියන 30 ක් අපි වියදම් කරනවා ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ප්‍රතිපාදන ලැබෙනවා .

මේකෙදී මහබැංකු වාර්තාව අනුව අඩුම ආදායම් තිබෙන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තමයි මුල්න්ම තොරාගන්නේ මහබැංකු වාර්තාව අනුව මුල්වටයේ මේවන විට සියඹලාණ්ඩුව, කැබිලිතිගොල්ලෑව, කන්තලේ, සේරුවිල, ත්‍රිකුණාමලය ඒ වගේම ද්‍රවිඩ ගත්තත් එහෙමයි මුස්ලිම් ගත්තත් එහෙමයි ඒ ආදී වශයෙන් අඩුම ආදායම් තිබෙන අඩු පහසුකම් තිබෙන ලේකම්

කොට්ඨාශ වලින් තමයි පටන් ගන්නේ ඉතින් මේ යටතේ පාසල් 325 ක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් එක බැගින් අපි තනනවා. එතකොට ඔබ අහපු අර දෙවැනි ප්‍රශ්නයට ග්‍රාමීය ප්‍රදේශවලට සම්පත් බෙදනවයි කියන එක, ඒකට තමයි පදනම් කරගෙන තියෙන්නේ.

**අහන්නත් සතුටුයි ඇමතිතුමා ඇත්තෙන්ම ශ්‍රී ලංකිකයෝ ලෙසත් අපි අපේ නායක හිමියොත් අපි ඔක්කොම අපේ රටේ දියුණුව අපේ රට ගැන අපිට ජාතික කැක්කුමක් තිබෙනවා**

**ප්‍රශ්නය: අවසන් වශයෙන් ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න ඕන සමහර විට ඔබතුමා මේ ගැන පියවරක් ගෙන ඇති කනගාටුවෙන් වුනත් කියන්න ඕන අපි ලංකාව අත්හැරලා නොයෙක් නෙයෙක් ප්‍රශ්න මත බොහෝ පිරිසක් පිටරටවල ජීවත් වෙනවා. අවාසනාවකට වාගේ ඒ රටවල ඉන්නකොට ඒ රටට ගැලපෙන භාෂාව අපි කථාකරනවා. ඒක හොඳ තත්වයක් වුනත් අපේ මව් බස අමතක කිරිම ගැටලුවක් එය ඉතා අවාසනාවන්ත සිද්ධියක් විදෙස් රටවල ඉන්න ශ්‍රී ලාංකික දරුවන්ට සිංහල උගන්වන්න නව තාක්ෂණය උපයෝගි කරගෙනවත් මේකට වැඩපිළිවෙලක් සකස් කර නැද්ද ?**

**පිළිතුර:** ඔව් එකට ක්‍රම දෙකක් යටතේ තිබෙනවා මම දැන් ලොව ප්‍රධාන රටවල් බොහොමයකට ගිහිල්ලා තියෙනවා මැදපෙරදිග ඩුබායි වැනි රටවලටත් ගිහිලල්ලා තිබෙනවා දැන් මේවන විට ඩුබායි වල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රශ්චාත් උපාධි ආයතනයේ විදේශ ශාඛාව ආරම්භ කරලා තිබෙනවා ඉංග්‍රිසි මාධ්‍යයෙන් කරන්නේ නමුත් සිංහල අය තමයි සියයට අනුනවයක් උපාධිය කරන්නේ එහිදී මට දැනගන්න ලැබුනා ඒ අයගේ දරුවන්ට සිංහල ඉගෙනගන්න විශාල වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙන වග ඩුබායි වල තිබෙන අපේ තානාපති කාර්යාල පරිශ්‍රය තුල 300 කට වැඩි පිරිසක් හැම ඉරිදාවකම දහම් පාසලට එනවා. ඒ වගේම එංගලන්තය ඇමරිකාව මොන රටක වුනත් අපි දකිනවා අපේ පන්සල් ආශ්‍රයෙන් දහම් පාසල් ක්‍රියාත්මක වෙනවා එහිදී සිංහලත් බුද්ධාගමත් විදේශ රටක හිටියා වුනත් හොඳින් ඉගෙන ගන්නවා. මේ සඳහා අවශ්‍ය ප්‍රවේෂය තිබෙනවා.

හැබැයි ඊට අමතරව ඔබගේ දෙවන යෝජනාව වැදගත් මොකද තාක්ෂණටය අද ගොඩක් දියුණු නිසා අන්තර්ජාලය ඔස්සේ අපේ ලංකාවෙත් දැන් විහාරස්ථානවල පිරිවෙන්වල පාසල්වල අමාත්‍යංශ වෙබ් අඩවි ආරාම්භ කරලා තිබෙනවා. ඒවායේ සංකේත ටික විතරයි අවශ්‍ය වෙන්නේ. අන්තර්ජාලය ඔස්සේ ගොස් ඉගෙන ගන්න පුළුවන්. දැන් භාෂාවක් උච්චාරණය කිරිම යන දෙයක් ප්‍රශ්නයක් තිබේනම් එයටත් දැන් මෘදුකාංග නිෂ්පාදනය වෙලා තිබෙනවා. ඒක නිසා අවශ්‍ය නම් අපිට පුළුවන් සකස් කරන ලද මෘදුකාංග ලැබෙන්නට සලස්වන්න. අපි දැන් පාසල්වල විෂය ධාරාවන් වල විවිධ මාතෘකා ඔස්සේ මෘදුකාංග නිෂ්පාදනය කරලා තිබෙනවා. ඒ වගේම අපේ නැදිමාල බෞද්ධ මධ්‍යස්ථානයේ අපේ හාමුදුරුවෝ සීඩි විශාල ප්‍රමාණයක් නිර්මාණය කරලා තිබෙනවා. එහි ධර්ම කරුණු සාහිත්‍යය විවිධාකාරයේ ඒවා නිපදවා තිබෙනවා. ඉතිං මම හිතන්නේ නව තාක්ෂණය යොදාගෙන අපේ ඒ රටවල ඉන්න ලාංකිකයෝ සංවිධානය වෙනවා නම් ලොකු ප්‍රශ්නයක් නෙවෙයි ඒක ඒ තුලින් ඒ අවබෝධය අපේ දරුවන්ට ලබාදෙන්න පුළුවන්.

**මම අපේ J9 රේඩියෝව වෙනුවෙන් ප්‍රශ්න ඇසීම නතර කරනවා මම හිතන්නේ ඉතාම වැදගත් අවස්ථාවක ඉතා වැදගත් කරුණු ටිකක් දැනගත්තා මම අපේ නායක හිමිපාණන්ට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබාදීම ගැන.**

**ඔබතුමාට දිගාසිරි**

සාකච්ඡා කළේ බන්දු ගුණවර්ධන ප්‍රංශයේ සිට